## 13. ශීර්ෂ 11 - මුදල් කොමිෂන් සභාව

### 13.1 විසර්ජන ගිණුම

#### 13.1.1 අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයකට සළසා තිබුණු රු.400,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ආ) වැය විෂයයන් 11 කට රු.6,700,000 ක අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 16 ත් සියයට 100 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

### 13.2 අභ්‍යන්තර විගණනය

මුදල් රෙගුලාසි 133 පරිදි අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

### 13.3 විගණන හා කළමනාකරණ කමිටුව

කොමිෂන් සභා කාර්යාලයෙහි 2014 වර්ෂයේ දී විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් පවත්වා නොතිබුණි.

### 13.4 මානව සම්පත් කළමනාකරණය

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 16 | 06 | 10 |
| (ii) තෘතියික මට්ටම | 03 | 03 | - |
| (iii) ද්විතියික මට්ටම | 44 | 24 | 20 |
| (iv) ප්‍රාථමික මට්ටම | 13 | 09 | 04 |
| **එකතුව** | **76** | **42** | **34** |